**නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම - 2016**

----------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරී සමාගම් විසින් මට සහය වන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම**

--------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (" මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීමවලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම් විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ හා සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

------

සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් කරුණු

---------------

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පොදු පරිචයේ යෙදෙන වෙනත් වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කර 2016 මැයි 27 දින එම මූල්‍ය ප්රකාශන මත විකරණය නොකරන ලද මතයක් ප්‍රකාශ කරන ලදී.

### 2.3 අනිකුත් නීති හා නියාමන අවශ්‍යතා මත වාර්තාව

--------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත පරිදි ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා වන පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මගේ මතය තුළ:

(i) විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ කරුණු මා විසින් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණ වලින් පිළිබිඹු වන පරිදි, සමාගම හා සමූහය විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා තබා තිබුණි.

(ii) සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

### 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2015 අංක 09 දරන දේශීය ආදායම් පනතේ 32 (1) වගන්තිය | 2008/2009 න් ආරම්භ වන පූර්ව තක්සේරු වර්ෂ 05 ක් සඳහා එකතුව රු.270,368,574 ක ආදායම් බදු තක්සේරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සමාගමට ලැබී තිබුණ ද එම බදු, ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට 2017 දෙසැම්බර් 27 වන විටත් සමාගම විසින් කටයුතු කර නොතිබුණි. ප්‍රතිඵලයක් වශයෙන්, ගෙවීම් ප්‍රමාද කිරීම මත දඩයෙන් සියයට 50 ක් ලෙස එකතුව රු.126,061,875 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවලට සටහනක් ලෙස හෙළිදරව් කිරීම හැර සමාගම විසින් බදු වගකීම සඳහා කිසිඳු වෙන් කිරීමක් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | සමාගම විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු වුවත් එසේ අනුකූල වී නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය | සමාගම විසින් එහි ආරම්භයේ සිටම සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 75 වගන්තිය | 2016 දෙසැම්බර් 31 දින, අධ්‍යක්ෂවරු 05 දෙනාගෙන් තිදෙනෙකු ඔවුන්ගේ රාජකාරි කටයුතුවලින් ඉල්ලා අස්වී තිබුණි. එසේ වුවද, 2017 ජනවාරි 23 දින වන විටත් නව අධ්‍යක්ෂවරු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | මහපොළ භාර අරමුදල හා සමාගම අතර ඇති කරගත් අරමුදල් කළමනාකරණ ගිවිසුමේ 2.2 වගන්තිය | (i) ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ආයෝජන කමිටුවට සාමාජිකයන් පත්කර නොතිබුණි. එබැවින් මෙම කමිටුව විසින් ගන්නා ලද තීරණවල වලංගුභාවය විගණනයට ගැටළු සහගත වේ. |
| | | (ii) දෙපාර්ශවය විසින් එකඟ වූ ආයෝජන සැලැස්මට අනුව සමාගමේ අරමුදලට වූ ආදායම්, මහපොළ භාර අරමුදලට (MTF), වරින් වර කරනු ලබන ඉල්ලීම් මත ලබාදිය යුතු වේ. එසේ වුවද පිළිවෙලින් රු.250,000,000 ක් හා රු.50,000,000 ක් ඉල්ලා 2015 නොවැම්බර් 16 දින හා 2017 ජනවාරි 17 දින මහපොළ භාර අරමුදල විසින් සමාගම වෙත කරන ලද ඉල්ලීම සමාගම විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය
----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉකුත් වර්ෂයේ සමාගමේ බදු පෙර ශුද්ධ ලාභය වූ රු.113,659,868 ට හා ඊට අනුරූපීව සමූහයේ බදු පෙර ශුද්ධ අලාභය වූ රු.186,420,983 ට සාපේක්ෂව සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ හා සමූහයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වලින් බදු පෙර ශුද්ධ අලාභය රු.86,361,454 ක් හා රු.585,948,925 ක් පිළිවෙලින් වූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු. 200,021,322 ක හා රු.399,527,942 ක පිරිහීමක් පෙන්නුම් කරන ලදී. සමාගමේ හා සමූහයේ ශුද්ධ ආයෝජන ආදායම රු.194,315,026 ක් හා රු.680,556,237 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පරිහානියට අදාළ මූලික හේතුව විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්
--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙළඳපල ඉල්ලුම සපුරාලීමේ අරමුණින්, මුදල් ගලායාම් අවම කරමින් අලෙවිකරණ උපායමාර්ග සුදුසු ලෙස ක්‍රියාත්මක කිරීමට සමාගම අපොහොසත් වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද සමාගම විසින් ශක්තිමත් සේවාදායක පදනමක් ඇතිකර ගෙන

නොතිබුණි. එබැවින් 2015 හා 2016 වර්ෂවලදී පමණක් සමාගම විසින් රු.මිලියන 699.67 ක සමුච්චිත අලාභයක් දරා තිබුණි.

(ආ) මහපොළ භාර අරමුදල හා සමාගම අතර ඇතිකරගත් අරමුදල් කළමනාකරණ ගිවිසුමට අනුව, මහපොළ භාර අරමුදල කළමනාකරණය කිරීමේ අරමුණ ඇතිව සමාගම සංස්ථාපනය කර තිබුණි. එසේ වුවද මෙම අරමුණ සම්බන්ධයෙන් සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය තුළ කිසිදු විධිවිධානයක් ඇතුලත් කර නොතිබුණි. එබැවින් අරමුදල් කළමනාකරණ ගිවිසුමේ වලංගුභාවය ගැටළු සහගත විය.

**4.2 අවිධිමත් ගණුදෙනු**

**------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 දී සමාගම විසින් ප්‍රාථමික ගැණුම්කරුවකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇත. මහපොළ භාර අරමුදල හා සමාගම අතර ඇතිකරගත් අරමුදල් කළමනාකරණ ගිවිසුමේ 2.1 වගන්තිය අනුව, MTF විසින් පත් කරන ලද ආයෝජන කමිටුව විසින් සියලු ආයෝජන තීරණ ගත යුතුව තිබුණි. එසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව එම සමාගමේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ හා ප්‍රධාන ගණුදෙනුකරු, ට්‍රිලියන් සිකියුරිටීස් පුද්ගලික සමාගම හා වර්වුවල් ඉන්වෙස්ට්මන්ට ඇන්ඩ් ට්‍රේඩින් ලංකා පුද්ගලික සමාගම නම් වූ පුද්ගලික සමාගම් 02 ක් සමග ප්‍රතිමිලදී ගැණුම් ගණුදෙනු සිදුකිරීම සම්බන්ධයෙන් වූ ආයෝජන තීරණ ගැනීමට සම්බන්ධවී තිබුණි. තවද මේ සම්බන්ධයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. පසුව, මේ සම්බන්ධයෙන් සමාගම විසින් වෝහාරික විගණනයක් සිදුකර තිබුණ අතර මෙම වෝහාරික විගණන වාර්තාවට අනුව ඉහත නිලධාරීන් අවිධිමත් ගණුදෙනුවකට සම්බන්ධ වී තිබුණු බව අනාවරණය විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(i) විගණිත දිනය වන විටත් සමාගම විසින් සම්බන්ධිත පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික ගණුදෙනුකරු) රීති අංක 11 (2), 2009 ජුනි 24 දිනැති රීති අංක 01/2009 හා ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් (ප්‍රාථමික ගණුදෙනුකරු) රීති අංක 11 (2), 2009 ජුනි 24 දිනැති රීති අංක 01/2009 අනුව හිමිවන බලය යටතේ ඉහත සේවායෝජකයන් දෙදෙනා සමග වූ ප්‍රධාන ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුමට අනුව, ප්‍රතිමිලදී ගැණුම් ගණුදෙනු තුළින් ඇතිවන සියලු ගාස්තු උක්ත සේවායෝජකයන් දෙදෙනාට නියමිත පරිදි ගෙවීමට උපදෙස් දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 අගෝස්තු 07 දින සමාගමට නියෝගයක් නිකුත් කර තිබුණි. CBSL විසින් මෙම නියෝගය අවලංගු කර නොතිබුණු හෙයින් සමාගම ඒ අනුව කටයුතු කිරීමට වගකීමට බැඳේ.

(iii) CBSL විසින් කරන ලද මෙම නියෝගයට එරෙහිව සමාගම විසින් 2015 අගෝස්තු 18 දින අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනුකර තිබුණු අතර 2015 සැප්තැම්බර් 04 දක්වා එම නියෝගය ක්‍රියාත්මක නොකරන ලෙස ප්‍රකාශ කරමින් අභියාචනාධිකරණය විසින් අතුරු නියෝගයක් නිකුත් කර තිබුණි. එසේ වුවද වගඋත්තර පාර්ශවකරුවන් සියලු දෙනා විසින් කරන ලද ඉල්ලීම සලකා බලා 2016 මාර්තු 29 දින උක්ත අතුරු නියෝගය අභියාචනාධිකරණය විසින් ඉල්ලා අස් කරගෙන තිබුණි. පසුව, අභියාචනාධිකරණය විසින් ලබාදුන් තීන්දුව අභියෝගයට ලක්කරමින් 2016 අප්‍රේල් 18 දින සමාගම විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් අභියාචනයක් කර තිබුණි. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාගමට පක්ෂපාතීව

කිසිඳු තීරණයක් ලබාදී නොතිබුණි. එහෙත් 2016 දෙසැම්බර් 27 දින වෝහාරික විගණන වාර්තාව සමාගම විසින් CBSL වෙත ලබාදී තිබුණි. එසේ වුවද මෙම වාර්තාවේ දිනය විටත් CBSL මෙ සම්බන්ධයෙන් කිසිඳු නියෝගයක් සමාගමට ලබාදී නොතිබුණි.

(ආ) අවිධිමත් තැරැව් ගාස්තු

--------------------------

2014 වර්ෂයේදී පෞද්ගලික සමාගම් 02 කට (වයිට් ග්‍රෝව් හෝල්ඩින්ග්ස් හා ඇස්ට්‍රල් කැපිටල් හෝල්ඩින්ග්ස් ) ගෙවන ලද රු.19,725,000 ක් වූ අවිධිමත් තැරැව් ගාස්තු සම්බන්ධයෙන් සමාගම විසින් 2016 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. මෙම සමාගම් මූල්‍ය සමාගම් ලෙස CBSL යටතේ ලියාපදිංචි වී තිබේද යන්න ගෙවීම කිරීමට පෙර සමාගම විසින් සනාථ කරගෙන නොතිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය. එසේම 2016 වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මෙම ගණුදෙනුව හෙළිදරව් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි.